අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ සංචාරක බංගලා භාරකරු තනතුර සඳහා සීමිත පදනමින් බඳවා ගැනීම -2026

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ සංචාරක බංගලා භාරකරු තනතුරේ පවතින **පුරප්පාඩු 01** ක් සඳහා සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

ස්ථානය - **රක්වාන සංචාරක බංගලාව**

- අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2026 දෙසැම්බර් 15 දින වේ.

1. බඳවා ගැනීමේ සුදුසුකම්

අයදුම්කරු විසින් තනතුරට බඳවා ගැනීමේ සුදුසුකම් සියල්ල මෙම නිවේදනයේ සඳහන් අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

1.1 සාමාන්‍ය සුදුසුකම්

I. ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය
II. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය
III. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ /ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට සුදුසුකම් සියල්ල සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය

1.2 කායික සුදුසුකම්

අයදුම්කරු ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

1. 3 වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද -

1.3.1 වෘත්තීය සුදුසුකම් -

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) දෙවැනි හෝ තුන්වැනි මට්ටමට නොඅඩු මට්ටමක සංචාරක බංගලා භාරකරු තනතුරට අදාළ අමුත්තන් පිළිගැනීම ආහාර පිළියෙළ කිරීම හා සංග්‍රහය , සංචාරක නිවාස අභ්‍යන්තර හා බාහිර අලංකරණ යටතේ ප්‍රවීණතාවක් අත් කරගෙන තිබිය යුතුය.

1.3.2 පළපුරුද්ද

අධිකරණවල අමාත්‍යාංශගත පහත සඳහන් කර ඇති තනතුරුවල ස්ථීර කරන ලද වසර 02 කට නොඅඩු සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවකයින් -

1.සිතාසි බෙදන්නා
2.සෝෂක ප්‍රවේශක
හෝ

අධිකරණවල අමාත්‍යාංශගත පහත සඳහන් කර ඇති තනතුරුවල ස්ථීර කරන ලද වසර 05 කට නොඅඩු සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවකයින් -

1. අධිකරණ ආරක්ෂක

2. පිස්කල් පියන්

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED

2. සේවයට බඳවා ගැනීමේ ක්‍රමය -

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කරනු ලබන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන වෘත්තිය පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගනු ලැබේ.

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

2.1 වෘත්තිය පරීක්ෂණය

විෂයයන්	උපරිම ලකුණු ප්‍රමාණය	සමත් ලකුණු ප්‍රමාණය
1.ක්ෂේත්‍රයට අදළ මූලික දැනුම	20	අදාල නොවේ
2. උපකරණ සවි කිරීම අලුත්වැඩියා කිරීම පිලිබඳ දැනුම	20	
3. අදාල ක්ෂේත්‍රයේ උපකණවල දෝෂ හදුනා ගැනීම පිලබඳ දැනුම	40	
4.ක්ෂේත්‍රයට අදාළ උපකරණ භාවිතය පිලිබඳ දැනුම	20	
එකතුව	100	

I. මෙම පරීක්ෂණය අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලැබේ.

2.2 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය -

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ.

පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ	උපරිම ලකුණු ප්‍රමාණය	සමත් ලකුණු ප්‍රමාණය
1.අධ්‍යාපන සුදුසුකම්	15	අදාල නොවේ
2. අතිරේක පලපුරුද්ද	60	
3. අතිරේක වෘත්තීය සුදුසුකම්	20	
4.සම්මුඛ පරීක්ෂණයේදී පිලිඹිඹු කරන කුසලතා හා පෞරුෂය සඳහා	05	
එකතුව	100	

සටහන - වෘත්තීය පරීක්ෂණයෙන් සමත් ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් අතරින් පුරප්පාඩු සංඛ්‍යාව මෙන් තුන් ගුණයක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.වෘත්තීය හා ව්‍යුහගත පරීක්ෂණ දෙකෙන්ම ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් අතුරෙන් කුසලතා අනුපිලිවෙල අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාවට බඳවා ගැනේ.

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

3. වැටුප් පරිමාණය -

3.1 මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 දරන වැටුප් චක්‍රලේඛයට අනුව PL 2 -2025 රු.41,800.00-10 x490-10x540-10x590-12x630-රු.65,560.00 ක) වැටුප් පරිමාණයක් හිමි වේ. 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි උපලේඛණ II අනුව වැටුප් ගෙවනු ලැබේ.

මෙයට අමතරව රජයේ නිලධාරීන්ට රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනා ද මෙම තනතුර දරන්නාට හිමි වනු ඇත.

4. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි -

I. මෙම තනතුර ස්ථිරය. (තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් වේ.)

II. මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරියකු එක් වසරක වැඩ බැලීමේ කාලයකට යටත් වන අතර, සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

III. 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා ඊට අනුෂංගික චක්‍රලේඛ අනුව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීණතා මට්ටම වසර 05 ක් තුළ දී ලබාගත යුතුය. රාජ්‍ය භාෂාවක් නොවන මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් පරිවාස කාලය තුළදී නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගත යුතුය.

5. අයදුම් කිරීමේ ක්‍රමය -

I. අයදුම්පත්‍රය, නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම් පත්‍රයට අනුකූල විය යුතු අතර සෙ.මී 22-29 ප්‍රමාණයේ A4 කඩදාසි වල සකස් කළ යුතුය. 1-13 තෙක් ශිර්ෂ පළමුවන පිටුවට ද, 14 සිට අවසන් වන තෙක් ශිර්ෂ දෙවන හා තුන්වන පිටුවලට ද වන ලෙස ගෙන සකස් කර තොරතුරු සම්පූර්ණ කළ යුතුය. සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන, මුලික සුදුසුකම් සම්පූර්ණ කර නොමැති, නියමිත දිනට පසුව ලැබෙන හෝ ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන අයදුම්පත් , දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදාල අයදුම්පත්‍රයේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. අයදුම්පත ලැබුණු බව දන්වනු නොලැබේ.

II. මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2026 දෙසැම්බර් 15 දිනට හෝ ඊට පෙර **"අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය, නො.19, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10"** යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ III ශ්‍රේණියේ සංචාරක බංගලා භාරකරු තනතුරු සඳහා බඳවා ගැනීම (සීමිත) - 2026"** යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය.

III. අයදුම්පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා අයදුම්පත්‍රයක් ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතුය

IV. අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපත් ඇමිණීමෙන් වැලකිය යුතුය.

V. අවශ්‍ය අවස්ථාවක දී ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයින්ගේ අයදුම්පත් ගැන සලකා බලනු නොලැබේ.

VI. අපේක්ෂකයෙකුට සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු වේ.

VII. සියලුම අයදුම්කරුවන් මෙම ගැසට් පත්‍රයේ සඳහන් පොදු විභාග නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

06. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය -

6.1 අපේක්ෂක/අපේක්ෂිකාවන් පරීක්ෂණ ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම පරීක්ෂණයක් සඳහා ම මණ්ඩලය සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාවය සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලේඛන පමණක් වලංගු වේ.

I. ජාතික හැඳුනුම්පත
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය
III. වලංගු රියදුරු බලපත්‍රය

07. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් -

අපේක්ෂකයෙකුට අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් ඕනෑම අවස්ථාවකදී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කෙරේ. අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව රජයේ සේවයට පත් කිරීමෙන් පසු අනාවරණය වුවහොත් , එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමින් යටපත් කර ඇත්නම් ඔහු/ ඇය රජයේ සේවයෙන් පහ කිරීමට කටයුතු කෙරේ.

08. අත්සන සහතික කිරීම

අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මාර්ගයෙන් එවිය යුතුය. නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරා ගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කල යුතුය.

9 . පොදු කරුණු

- අයදුම්කරුවන් අයදුම්පතේ පිටපතක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතුය
- රාජ්‍ය සේවයේ පත්කිරීම් පාලනය කෙරෙන පොදු කොන්දේසි ද, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යය පටිපාටික රීති ද , ආයතන සංග්‍රහයේ විධි විධාන ද, මුදල් රෙගුලාසි ද, කලින් කලට රාජ්‍ය සේවය සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ හා අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ සංචාරක බංගලා භාරකරුවන් සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියේ කොන්දේසි ද මෙම තනතුර සඳහා අදාළ වේ.

- මෙම පුරප්පාඩු සම්පූර්ණයෙන් හෝ එයින් කොටසක් පිරවීම අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ ලේකම්ගේ අභිමතය පරිදි වේ.

- සිංහල හා දෙමළ මාධ්‍යන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇතිවුවහොත් සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

ජනාධිපති නීතිඥ අයෙෂා ජිනසේන
ලේකම්
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය
2026/..../.....

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED